**මුදල් ආර්ථික ස්ථායිකරණ සහ**
**ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය**

# ජාතික රක්ෂණ භාර අරමුදල (NITF)

## ඇබෑර්තු

මුදල් ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය යටතේ ස්ථාපිත කර ඇති ජාතික රක්ෂණ භාර අරමුදල, අග්‍රහාර වෛද්‍ය රක්ෂණය මෝටර් රථ රක්ෂණය වැනි රක්ෂණ යෝජනා ක්‍රම ක්‍රියාත්මක කරන අතර දේශීය රක්ෂණකරුවන්ගේ ප්‍රතිරක්ෂකයා වශයෙන් කටයුතු කරන ශ්‍රී ලංකාව තුළ ස්ථාපිත කර ඇති එකම ආයතනය වේ. එම අරමුදල් මණ්ඩලය වසර 16 ක වැනි කෙටි කාලයක් තුළදී නව්‍යකරණය වර්ධනය සහ ලාභදායීත්වය සැලකීමේදී දේශීය රක්ෂණ කර්මාන්තයේ ප්‍රමුඛ ස්ථානයක් හිමිකර ගෙන ඇති රාජ්‍ය ආයතනයකි.

ජාතික රක්ෂණ භාර අරමුදල් මණ්ඩලයේ පහත සඳහන් පුරප්පාඩු සඳහා සුදුසුකම්ලත් පුද්ගලයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## 1. කළමනාකරණ සහකාර - III ශ්‍රේණිය

**බාහිර අයදුම්කරුවන්**

**සුදුසුකම්**

**අ.පො.ස. (සා/ පෙළ) විභාගය,**

1. සිංහල/ දෙමළ
2. ගණිතය

විෂයයන් ඇතුළත්ව සම්මාන සාමාර්ථ හතරක් සහිතව විෂයයන් හයකින් එක් වරකදී සමත්ව සිටීම,

**සහ**

අ.පො.ස (උ/ පෙළ) විභාගය, (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර ) විෂයයන් තුනකින් සමත්ව සිටීම.

රක්ෂණ / ගණකාධිකරණ ක්ෂේත්‍රයේ වෘත්තිය සුදුසුකම් ලබාතිබීම අමතර සුදුසුකමක් වේ.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

ප්‍රාථමික ශ්‍රේණියට අයත් (පුහුණු/ අර්ධ පුහුණු/ නුපුහුණු) නිලධාරීන්.

**අ.පො.ස. (සා/ පෙළ) විභාගය,**

1. සිංහල/ දෙමළ
2. ගණිතය

යන විෂයයන්ද ඇතුළත්ව සම්මාන සාමාර්ථ හතරක් සහිතව විෂයයන් හයකින් සමත්ව සිටීම.

**සහ**

ඉහත සඳහන් ශ්‍රේණිවල ස්ථිර සේවයේ අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතුය.

**වැටුප් පරිමාණය :**

MA 1-1-2016: රුපියල් 27,910-10X300+7X350+4X495+ 20X660-48,540

**වයස :** අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර, 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්හට මෙම ඉහළ වයස් සීමාව අදාළ නොවේ.

**පත්කිරීමේ ස්වභාවය :**

මෙම පත්වීම ස්ථිර පත්වීමක් වේ. සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල සඳහා හිමිකම් ඇත.

## 2. තොරතුරු තාක්ෂණ සහකාර - III ශ්‍රේණිය

**බාහිර අයදුම්කරුවන්**

**සුදුසුකම්**

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණ/ වෘත්තීය අභ්‍යාස ආයතනයකින් නිකුත් කළ තොරතුරු තාක්ෂණය පිළිබඳ ජාතික වෘත්තීය සුදුසුකම් 5 වන මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබාතිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා අවශ්‍ය සුදුසුකම් ලබාතිබීම

**වැටුප් පරිමාණය :**

MA 2-1-2016: රුපියල් 30,310-10X300+7X350+4X495+ 20X660-50,940

**වයස :** අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර, 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්හට මෙම ඉහළ වයස් සීමාව අදාළ නොවේ.

**පත්කිරීමේ ස්වභාවය :**

මෙම පත්වීම ස්ථිර පත්වීමක් වේ. සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල සඳහා හිමිකම් ඇත.

**සියලුම අයදුම්කරුවන් :**

* ශ්‍රී ලාංකික පුරවැසියන් වියයුතුය.
* තනතුරට අදාළ පැවරෙන රාජකාරී නිසි අයුරු ඉටුකිරීම සඳහා හොඳ මානසික හා ශාරීරික සුවතාවයකින් යුක්ත විය යුතුය.
* විශිෂ්ට චරිතයකින් යුක්ත අයකු විය යුතුය.

**අයදුම්පත් :**

* සියලු ජීව දත්ත, ඥාති නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ නම් හා ලිපිනයන් අධ්‍යාපන සුදුසුකම්වල විස්තර, වෘත්තීය සුදුසුකම් සහ අදාළ සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාළ සහතිකවල පිටපත් සමග සකස් කළ අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. තවද, දැනටමත් රජයේ සේවයේ / සංස්ථාවල/ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානී මාර්ගයෙන් යොමු කළ යුතුය.
* අයදුම්පත් බහාලූ කවරයේ වම් ඉහළ කෙළවරේ **අයදුම් කරනු ලබන තනතුර** සඳහන් කළ යුතුය.
* සියලුම අයදුම්පත්, ලියාපදිංචි තැපෑලෙන් ප්‍රධාන විධායක නිලධාරී, ජාතික රක්ෂණ භාර අරමුදල් මණ්ඩලය, අංක 95, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත, කොළඹ 02 යන ලිපිනයට 2023.03.27 දිනට පෙර ලැබීමට සැලැස්විය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ.

**ප්‍රධාන විධායක නිලධාරී,**
**ජාතික රක්ෂණ භාර අරමුදල,**
**අංක 95,**
**ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත,**
**කොළඹ 02.**